# ද්වි ආංශික ආකෘතිය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්

එච්.පි දුලිනා දිල්හානි ආරියසිංහ[1]

**සංක්ෂේපය**

ලොව ආර්ථික විපර්යාසයකට, චින්තන විපර්යාසයකට විවිධ වියතුන්ගේ අදහස් මූලික වෙයි. ලොව පවතින්නේ එබඳු අදහස් වලින් මිස අන් කවරකින් නොවේ. ඒ අතර ආතර් ලුවිස් ඉදිරිපත් කළ ද්වි ආංශිකයට වැදගත් තැනක් හිමි වේ. ඔහු ඉදිරිපත් කරනු ලබන ද්වි අංශික ආකෘතිය හරහාද ඔහුගේ විග්‍රහය මෙහි අන්තර්ගත කොට ඇත. කෘෂිකර්මාන්තයේ අතිරික්ත ශ්‍රමය කාර්මික අංශයට යොදා ගැනීමෙන් සිදුකළ හැකි ආර්ථික සංවර්ධනය පිළිබඳ ඔහුගේ න්‍යායෙන් ඉදිරිපත් කරනු ලබයි. මේ සඳහා යොදාගෙන ඇති උපකල්පන, එමෙන්ම එල්ල වී ඇති චෝදනා, යෝජනා පිළිබඳවත් අධ්‍යයනය කරනු ලබයි. ඒ අනුව ද්වි අංශක ආකෘතිය වර්තමානයට කොතරම් යෝග්‍ය වේ ද යන්න විශ්ලේෂණාත්මක විග්‍රහයකින් ද යුක්තය. සමස්තයක් ලෙස බලන විට ද්වි ආංශික ආකෘතිය නොදියුණු, දියුණු, දියුණු වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනයෙහි ලා කොතරම් උචිත වේද යන්න විවාදාත්මක ගැටලුවකි. ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට ද්වි ආංශික ආකෘතිය කොතරම් යෝග්‍ය වන්නේ ද යන්න විශ්ලේෂණාත්මක විග්‍රහයකින් ද යුක්ත ය. මේ සඳහා සඟරා , පොත්පත් , අන්තර්ජාල තොරතුරු වැනි ද්විතික දත්ත මූලාශ ලෙස යොදා ගැනුණි.

**මුඛ්‍ය පද** :- ද්වි ආංශික ආකෘතිය , ආතර් ලුවිස්

## හැඳින්වීම

අප හදාරනු ලබන න්‍යායන් සම්භාව්‍ය, නවසම්භාව්‍ය, නූතන වශයෙන් ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. එහි ලා බිහි වූ ආර්ථික න්‍යායන් අතර, සම්භාව්‍ය න්‍යායෙන් හමුවන ආතර් ලුවිස්ගේ ද්වි අංශක ආකෘතිය වැදගත් ස්ථානයක් ගනී.

ආතර් ලුවිස් විසින් ඉදිරිපත් කරන ලද මෙම න්‍යාය ශ්‍රම අතිරික්ත ආකෘතිය (Surplus Labour Model) යනුවෙන්ද හඳුන්වනු ලැබේ. 1954 දී රචනා කරන ලද (Economic Development with Unlimited Supplies of Labour) නම් රචනාව මගින් ආතර් ලුවිස් ඔහුගේ ද්වි අංශක ආකෘතිය පිළිබඳ අදහස් ඉදිරිපත් කරනු ලැබීය. මෙම න්‍යාය මගින් දියුණු වෙමින් පවතින රටක් සම්ප්‍රදායික යැපුම් කෘෂිකාර්මික අංශයේ සිට නූතන කාර්මික අංශය දක්වා පරිවර්තනය වන ආකාරය ද පැහැදිලි කර තිබේ. ඔහුගේ මෙම ආකෘතියට අනුව ශ්‍රමය සංවර්ධනයේ එන්ජිම (Labour is

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යාව දෙවන වසර, dilhaniariyasinghe@gmail.com

an engine of Development) හැටියට විස්තර කරනු ලැබීය. මෙම අදහස් Bentham (Labour shourd Occupy the FIrst Place in the Production System) යනුවෙන් ද දක්වන අදහස් හා එකඟතාවයක් පෙන්නුම් කරයි. ආතර් ලුවිස්ගේ න්‍යාය Gustav Ranis සහ John fee (1964) යන ආර්ථික විද්‍යාඥයින් විසින් තවදුරටත් දියුණු කරන ලදී. 19-20 සියවස්වල ගොඩනැගුණේ වෘද්ධිය හා සංවර්ධනය අතර වෙනසයි. මෙහිදී ආර්ථික තුළින් දුගී බව තුරන් කිරීමට, රැකී රක්‍ෂා විරහිත බව අඩු කිරීම සහ ආදායමේ ව්‍යාප්තියේ අසමාන බව අඩු කිරීම යන ආදිය කළ හැකි අතර, සංවර්ධනයන මගින් එම අසමානතාවන් අඩු කරන සංකල්පයක් බවත්, වෘද්ධිය හා සංවර්ධනය ඵලදායී ලෙස පවත්වා ගැනීමට බවත් ගම්‍ය විය.

**ආතර් ලුවිස්**

ද්වි ආංශික ආකෘතිය හඳුන්වා දුන් ආතර් ලුවිස් Castries නම් ප්‍රදේශයේ උපත ලැබීය. වයස අවුරුදු 15 දී පාසල් කටයුතු නිමා වීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලය ප්‍රවේශය ලබාගැනීමට අපේක්‍ෂා කරන අතර, ලිපිකරුවෙකු ලෙස ආතර් ලුවිස් සේවය කළේය. 1937 දී විද්‍යා උපාධියද, 1940 දී ආචාර්ය උපාධියද, 1947 දී ලන්ඩන් ආර්ථික විද්‍යා උපාධියද හැදෑරුවේය. ඔහුගේ ලිපි අතර, 1954 දී ලියන ලද (Economic Development with Unlimited Supplies of Labour) ආතර් ලුවිස් තියඩෝර්, ලුවිස් ද්විත්ව අංශයේ ආකෘතිය නැතහොත් ලුවිස් මාදිලිය ආකෘති සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ පුළුල් ප්‍රතිරූපයක් ගොඩනැගීමට සුදුසු වූ අතර, දියුණු රටවල ඓතිහාසික අත්දැකීම් පිළිබඳව විශ්ලේෂණයක් ද ඒකාබද්ධ ය.


**ආතර් ලුවිස්ගේ න්‍යාය පිළිබඳ උපකල්පන**

1. ආතර් ලුවිස් සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයෙක් මෙන් පෞද්ගලික ව්‍යාවසාය ආර්ථික ක්‍රමයක් පිළිබඳව උපකල්පනය කළේ ය.
2. ද්විත්ව ආර්ථිකය පිළිබඳ උපකල්පන ආතර් ලුවිස් විසින් ආර්ථිකය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දක්වා තිබේ.
   - යැපුම් ආර්ථිකය/ සාම්ප්‍රදායික අංශය (Subsistance Sector/ Traditional Sector)
   - ධනවාදී අංශය/ කාර්මික අංශය ( Capital Sector / Indusrial Sector )
3. සාම්ප්‍රදායික අංශය තුළ යැපුම් මට්ටමේ වැටුප් (Sunsistance wage rate) පවතින බව

ආතර් ලුවිස් විසින් සංවර්ධනය වන රටවල ශීඝ්‍ර ජනසංඛ්‍යා වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස, අතිරික්ත ශ්‍රම සැපයුමක් පවතින බවත්, එම අතිරික්ත ශ්‍රමය යැපුම් මට්ටමේ වැටුපකට ඕනෑ තරම් ප්‍රමාණයක් ලබාගත හැකි බවත්, උපකල්පනය කර තිබේ.

4. ශ්‍රමයේ ආන්තික ඵලදාව ශූන්‍ය හෝ ශූන්‍යයට ආසන්න බව.

සාම්ප්‍රදායික අංශය අධි ජනගහනයකින් යුක්ත වන අතර, ශ්‍රමය ආන්තික ඵලදාව ශූන්‍ය හෝ ශූන්‍යයට ආසන්න බවත් උපකල්පනය කර තිබේ.




කෘෂි අංශයේ අතිරික්ත ශ්‍රම සැපයුම හා ශ්‍රමයේ ආන්තික ඵලදාව ශූන්‍ය විට සංවර්ධනය වන රටවල කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රම සැපයුමක් දක්නට ලැබෙන බව ආතර් ලුවිස් විසින් පෙන්වා දී තිබේ. එම නිසා මුළු නිමැවුමේ කිසියම් අඩුවීමක් සිදු නොවී සංවිධාන ක්‍රමය ද වෙනසක් නොමැතිව කෘෂිකාර්මික අංශයේ ශ්‍රමිකයන්ගෙන් කිසියම් කොටසක් ඉවතට ගත හැකිබව මෙයින් කියැවේ.

මෙහි නිෂ්පාදන අංශයේ ශිල්පීය ඥානය නොවෙනස්ව පවතින බවත්, අන්‍ය නිෂ්පාදන සාධක දෙන ලද්දක් බවත් සලකතොත් ශ්‍රමය වන එක් විචල්‍ය සාධකයක් වැඩි වැඩියෙන් යොදා ගැනීමේදී කිසියම් අවස්ථාවකින් පසු ඉහළට නැගී ගිය නිෂ්පාදන ශ්‍රිතය තිරස් අක්ෂයට සමාන්තරව ගමන් කරයි. එයින් ප්‍රකාශ වන්නේ නිෂ්පාදනශ්‍රිතයේ එසේ ඉහළට නවතින අවස්ථාවෙන් පසු (R ලක්ෂ්‍යය) නිෂ්පාදන ශ්‍රිතයට එකතු වන ආන්තික ශ්‍රම ඒකකවල නිෂ්පාදන ශූන්‍ය අගයක් ගන්නා බවයි. ඒකී නිෂ්පාදනය උත්පාදනය කිරීම සඳහා OL1 ශ්‍රමය යොදවයි. OL1 ශ්‍රමය යොදවමින් ON1 ශ්‍රමිකයන්ට දවසකට a වශයෙන් පැය ගණනක් වැඩ කිරීමෙන් යොදවන බව පෙනී යයි. එම නිසා සංවිධානයේ කිසිදු වෙනසක් සිදු නොකර මුළු නිෂ්පාදිතයේ කිසිදු අඩුවක් සිදු නොවී. N1-N2 දක්වා ශ්‍රමික සංඛ්‍යාව එම නිෂ්පාදන අංශයෙන් ඉවත් කළ හැකිය. එසේ ඉවත් කළ හැකි ශ්‍රමික සංඛ්‍යාව එම අංශයේ අතිරික්ත ශ්‍රම සැපයුම ලෙස සැලකේ.


### 05. යැපුම් කෘෂිකාර්මික අංශයේ සහ ධනවාදී කාර්මික අංශයේ ශ්‍රම සැපයුම තුළ වෙනසක් දක්නට ලැබෙන බව.

ආතර් ලුවිස්ට අනුව යැපුම් අංශයේ ශ්‍රමිකයන්ගේ සාමාන්‍ය ඵලදාව ඉතා පහත් මට්ටමක පවතින අතර, ඔවුන් සාමාන්‍යයෙන් පසුගාමී, නූගත්, සරල දිවි පෙවෙතක් ගත කරන නුපුහුණු ශ්‍රමිකයන් වේ. ඊට ප්‍රතිවිරුද්ධ ධනවාදී අංශයේ උගත් පුහුණු ශ්‍රමිකයන් පිරිසක් සිටී. එම අංශයේ වැටුප් ලබන ශ්‍රමිකයන් පිරිසක් සේවා නියුක්ත

වී සිටින අතර, ශ්‍රම ඵලදායිත්වය ඉහළ මට්ටමක පවතී. ආතර් ලුවිස් දක්වන ආකාරයට ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සිදු වන්නේ කෘෂිකාර්මික අංශයේ සිටින අතිරික්ත ශ්‍රමය ක්‍රම ක්‍රමයෙන් නූතන කාර්මික අංශයේ ඵලදායී සේවා නියුක්ත කිරීමෙනි. යැපුම් අංශයේ අතිරික්ත ශ්‍රමයක් සිටින නිසා පවතින ස්ථාවර වැටුපකට කාර්මික අංශයට ශ්‍රමිකයන් ඇද ගැනීමට හැකි වේ. යැපුම් අංශයේ ශ්‍රමිකයන් ලබන වැටුපට වඩා 30% පටන් ඉහළ වැටුපක් ගෙවීමෙන් එම ශ්‍රමිකයන් කාර්මික අංශයේ ඉහළ ජීවන වියදම, ඉහළ ප්‍රවාහන වියදම්, ඉහළ බදු කුලී වැනි සාධක හේතුකොටගෙන යැපුම් අංශයට වඩා ඉහළ වැටුපක් ගෙවීමට සිදුවන අතර, ඒ නිසා අපරිමිත නම්‍යතාවයෙන් යුක්ත ශ්‍රම සැපයුම් වක්‍රයක් දක්නට ලැබේ.

**6. නූතන කාර්මික අංශයේ වර්ධනය සිදුවන්නේ කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය ඵලදායී ලෙස එම අංශයේ සේවා නියුක්ත කිරීමෙනි**

ධනවාදී කාර්මික අංශයේ වර්ධනය තීරණය වන්නේ ධනවාදී අතිරික්තය තුළින් ඇති කරගන්නා ප්‍රාග්ධන සම්පාදනය අනුව ය. කෘෂිකාර්මික අංශයෙන් ඇදගන්නා අතිරික්ත ශ්‍රමය කාර්මික අංශයේ සේවානියුක්ත කරගනී. එම ශ්‍රමිකයන්ට වැටුප් ගෙවීමෙන් පසු ඉතිරි වන ධනවාදී අතිරික්තය නැවත නැවත පුනරායෝජනය කිරීමෙන් ධනවාදී අංශයේ ප්‍රාග්ධන සම්පාදනය සිදුවේ.
ආතර් ලුවිස්ගේ ආර්ථික සංවර්ධන ආකෘතිය




$W_1$ ,W ශ්‍රම සැපයුම් වක්‍ර වේ. $D_1D_2$ සහ $D_3$ මගින් ශ්‍රම ඉල්ලුම් වක්‍ර දක්වේ. $OW_1$ මගින් දක්වෙන ස්ථාවර වැටුපකට ඕනෑතරම් ශ්‍රමික ප්‍රමාණයක් කෘෂිකාර්මික අංශයේ සිට කාර්මික අංශයට ඇදගැනීමට හැකි වේ යැයි ආතර් ලුවිස් අදහස් කරයි.

කාර්මික අංශයේ සමතුලිතතාව තීරණය වන්නේ ශ්‍රම ඉල්ලුම් වක්‍රය ශ්‍රම සැපයුම් වක්‍රය හා ස්පර්ශ වන අවස්ථාවේදී ය. එනම් මූර්ත වැටුප් ශ්‍රමයේ ආන්තික ඵලදාවට සමාන වන විට ය. එය $F_1$,$F_2$,$F_3$යන ලක්ෂ්‍ය ය මගින් පෙන්නුම් කෙරේ. එමගින් සමතුලිත සේවා නියුක්ති මට්ටම තීරණය වේ. ප්‍රථමයෙන් ම ශ්‍රමය සඳහා පවතින ඉල්ලුම සැපයුම අනුව කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය තුළ$OL_1$ ශ්‍රමය සඳහා ඉල්ලුමක් ඇති වේ. එවිට මුළු නිමැවුම $OD_1F_1L_1$ යන අක්ෂරවලින් දක්වෙන ප්‍රමාණය වේ. $OW_1F_1L_1$ ප්‍රමාණය ධනවාදී අංශයේ ප්‍රාග්ධන හිමියන් ලබන ලාභ ප්‍රමාණය වේ එය μ වලින් දක්වේ. ධන හිමියන් ලබන සියලුම ලාභ නැවත ආයෝජනය කරන බව ලුවිස් උපකල්පනය කරයි. එමගින් ආයෝජනය ඉහළ යන අතර, ශ්‍රම ඉල්ලුම් වක්‍රය D1-D2 දක්වා දකුණට විතැන් වේ. එවිට සමතුලිත සේවා නියුක්ති මට්ටම $F_2$ හිදී තීරණය වන අතර, කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමයෙන් තවත් කොටසක් සේවානියුක්ත කරගැනීමට හැකි වන නිසා කාර්මික අංශයේ සේවා නියුක්තිය F2 හි දී තීරණය වන අතර කෘෂිකාර්මික අතිරික්ත ශ්‍රමයෙන් තවත් කොටසක් සේවානියුක්ත කර ගැනීමට හැකිවන නිසා කාර්මික අංශයේ සේවා නියුක්ති L2 දක්වා ඉහළ යයි. එවිට මුළු නිමැවුම OD2F2L2 ප්‍රමාණය වේ. එහිදී OW1F2L2 ප්‍රමාණයක වැටුප් ගෙවූ පසු ලාභ ප්‍රමාණය W1D2F2 ලෙස තීරණය වේ. එය U2 මගින් පෙන්නුම් කෙරේ. එම ලාභය ද පුනරායෝජනය කරනු ලැබේ. එවිට ශ්‍රම ඉල්ලුම් වක්‍රය D3 දක්වා දකුණට විතැන් වීමෙන් $L_3$ දක්වා සේවා නියුක්තිය ඉහළ යයි. ඒ අනුව ලාභ ප්‍රමාණය ලෙස W1D3F3 ලෙස U3 මගින් දක්වෙන කොටසින් නිරූපණය කෙරේ. මේ ආකාරයට ධනවාදී අංශයේ සිදුවන නිෂ්පාදන ක්‍රියාවලිය සාම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය සම්පූර්ණයෙන් ම අවශෝෂණය කරගන්නා තෙක් දිගින් දිගටම ක්‍රියාත්මක වන බව ආතර් ලුවිස් විසින් පැහැදිලි කර තිබේ.

ද්වි ආංශික ආකෘතියට අනුව කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය ක්‍රමයෙන් ඉවත් වන විට කෘෂිකාර්මික අංශයේ භූමිය හා ශ්‍රම අනුපාතය ක්‍රමානුකූලව සංයෝග වීමෙන් කෘෂි ඵලදාව ඉහළ යයි. අනෙක් අතට ධනවාදී අංශයේ නිමැවුම සහ සේවා නියුක්තිය ඉහළ යාමෙන් කාර්මික හා කෘෂිකාර්මික අංශ දෙක අතර සමබර වර්ධනයකට ඉඩ සැලසේ.

ආතර් ලුවිස්ට අනුව ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන කාර්යභාරය තීරණය වන්නේ ප්‍රාග්ධන හා ශ්‍රමය යන සාධක දෙක මත ය. ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන ගැටලුව වශයෙන් ඔහු දකින්නේ සංවර්ධනය වන රටවල 4%-5% වැනි පහළ මට්ටමක පවතින ඉතිරි කිරීම් අනුපාතය 12% - 15% හෝ ඊට ඉහළ මට්ටමක් දක්වා වැඩි කරගන්නේ කෙසේද යන්නයි. ඊට හේතුව ආර්ථික සංවර්ධනය රඳා පවතින ප්‍රධාන සාධකය ප්‍රාග්ධන සම්පාදනය වීම යි. කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය ස්ථාවර වැටුපකට කාර්මික අංශයේ සේවානියුක්ත කළ හැකි නම්, ඵලදායී ධාරිතාවක ලාභයෙන් ඕනෑම කොටසක් පුනරායෝජනය කළ හැකි නම්, ජාතික ආදායමට සාපේක්ෂව ලාභය නොකඩවා වැඩි වන බවත්, ජාතික ආදායමට සාපේක්ෂව ප්‍රාග්ධන සම්පාදනය වැඩි වන බවත්, ආතර් ලුවිස්ගේ ද්වි ආංශික ආකෘතිය මගින් කියැවේ.

නමුත් වෘද්ධි ක්‍රියාවලියට අවිනිශ්චිතව ගමන් කළ නොහැකි ය. එය නැවතීමක් කරා ළඟා විය යුතු ය. පහත සඳහන් හේතු කාරණා එකක් හෝ කීපයක් මත මෙම වෘද්ධි ක්‍රියාවලිය අවසන් විය හැකි බව ආතර් ලුවිස් දක්වයි.

1. ධනවාදී අංශයේ සිදුවන ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රතිඵලයක් හැටියට කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය ඉවත් වී යන බව. ඊට පසු කෘෂි අංශයේ පවතින ශ්‍රමය ස්ථාවර මූර්ත වැටුපකට සේවය කිරීමට අකමැති වේ. එම නිසා අතිරික්ත ශ්‍රමය ඉවත්ව යාමෙන් පසු ශ්‍රම සැපයුම් වක්‍රය ඉහළ නගී.

2. යැපුම් අංශයේ අතිරික්ත ශ්‍රමය ක්‍රමයෙන් ඉවත් වෙද්දී එම අංශයේ කෘෂිකාර්මිකයන්ගේ ඵලදායිතාව ඉහළ යයි. ධනවාදී අංශයේ ලාභ වැඩි වන විට කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය ක්‍රමයෙන් ඉවත් වී යාමෙන් එම අංශයේ භූමිය හා ශ්‍රමය ගැළපී කෘෂිකාර්මිකයන්ගේ ආන්තික ඵලදාව ඉහළ යාමෙන් කෘෂි අතිරික්තයක් බිහිවේ. එවිට ශ්‍රමිකයන් නූතන කාර්මික අංශයේ සේවා නියුක්තිය කෙරෙහි තවදුරටත් කැමැත්තක් නොදක්වති.

3. නූතන කාර්මික අංශය වඩා වේගයෙන් වර්ධනය වීමේදී අමුද්‍රව්‍ය, ආහාර ද්‍රව්‍ය ආදියේ මිල ඉහළ යන අතර, මෙහිදී ධනවාදී අංශයේ ශ්‍රමිකයන් සඳහා වැටුප් වැඩි කිරීමට සිදු වේ. වැටුප් වැඩිවීම නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යාමෙන් ධනවාදී අතිරික්තය අඩු වී යයි. ධනවාදී අංශයේ ශ්‍රමිකයන් ධනේෂ්වර ජීවන රටාවක් ගත කරයි නම්, ඔවුන්ගේ ඉහළ වැටුප් ඉල්ලීම් සාර්ථක වුවහොත් ධනවාදී අතිරික්තය අඩු වීමෙන් ප්‍රාග්ධන සම්පාදනය හීන වී යයි.

   මෙකී තුන් ආකාරයට ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ඇනහිටිය හැකි බව ආතර් ලුවිස් පෙන්වා දී තිබේ.

(ජ්‍යෙෂ්ඨ මාහාචර්ය ප්‍රේමා පොඩිමැණිකේ මිය. , 2000 , "ආර්ථික සංවර්ධන න්‍යාය")

**ආතර් ලුවිස්ගේ න්‍යායට එල්ල වී ඇති විවේචන**

1. ආතර් ලුවිස්ගේ ද්වි ආංශික ආකෘතිය යම් යම් කොන්දේසි යටතේ අධික ජනගහනයකින් යුත් දියුණුවන රටවලට ගැළපෙන නමුදු න්‍යාය පදනම් වී ඇති උපකල්පන බොහෝ සංවර්ධනය වන රටවල ආයතනමය හා ආර්ථික ස්වභාවයන්ට ගැළපෙන්නේ නැත. සෑම සංවර්ධනය වන රටකම අතිරික්ත ශ්‍රමයක් දක්නට ලැබෙන්නේ නැත. විශේෂයෙන්ම දකුණු ඇමෙරිකාව, දකුණු අප්‍රිකාව වැනි රටවල් ඌන ජනගහනයකින් යුක්ත වේ. එවැනි රටවල් සම්බන්ධව මෙම උපකල්පනය අතාත්වික වේ. සමහර ආසියාතික


කෘෂිකාර්මික රටවල ශ්‍රම අතිරික්තයක් දක්නට ලැබුණත් එය කාලීන එකක් වේ.

2. කෘෂිකාර්මික යැපුම් අංශයේ ශ්‍රමය ධනවාදී අංශයට උරාගන්නා තෙක් මූර්ත වැටුප් ස්ථාවරය යන උපකල්පනය ද ප්‍රායෝගිකත්වයෙන් තොර වේ. ධනවාදී අංශයේ වර්ධනයත්, සමග යැපුම් අංශයේ විවෘත සේවා වියුක්තියක් තිබුණත් වැටුප් වැඩිවීම සිදුවේ. වර්තමානයේ ඊට වෘත්තිය සංගම්, ආයතනමය හේතු වැනි දෑ මගින් බලපෑම් ඇති වේ.

3. ලුවිස්ගේ න්‍යාය ගොඩනංවා ඇත්තේ කෘෂිකාර්මික අංශයේ සිටින අතිරික්ත ශ්‍රමය කාර්මික අංශයට ඇද ගැනීමෙන් හා ඊට සමානුපාතිකව කාර්මික අංශයේ ප්‍රාග්ධන සම්පාදනය හා සේවානියුක්තිය ඉහළ යන්නේය යන උපක්ලපනය මතය.

නමුත් ධනවාදීන් තම ලාභය, ශ්‍රමය ඉතිරි කරන නිෂ්පාදන ශිල්පීය ක්‍රම සඳහා යොදාගතහොත් කුමක් සිදුවේ ද යන ප්‍රශ්නය පැන නගී. ප්‍රස්තාර සටහනට අනුව මෙම අදහස පැහැදිලි කරගත හැකිය.

තාක්ෂණික ශිල්පක්‍රම භාවිතය හා ශ්‍රම ඉල්ලුම් වක්‍රය




ප්‍රස්තාර සටහනට අනුව සිරස් අක්ෂයෙන් මූර්ත වැටුප් හා ශ්‍රමයේ ආන්තික ඵලදාවත්, තිරස් අක්ෂයෙන් සේවා නියුක්තියත් දැක්වේ. ඉල්ලුම් වක්‍රය D1 සිට D2 දක්වා දකුණට විතැන් වන නමුදු E ලක්ෂ්‍යයෙන් පසු D2 ඉල්ලුම් වක්‍රය D1 ඉල්ලුම් වක්‍රයට වමින් පිහිටයි. මෙහිදී ශ්‍රමය ඉතිරි කරන නිෂ්පාදන ශිල්පීය ක්‍රම යොදා ගැනීම නිසා සේවා නියුක්තිය OL1 ප්‍රමාණයේ ම නොවෙනස්ව පවතී. එයින් පෙන්නුම් කරන්නේ සංවර්ධන විරෝධී සංවර්ධන ක්‍රියාවලියකි. අතිරේක ආදායම් ප්‍රාග්ධන හිමියන් සුළු පිරිසක් අතර බෙදී යයි. එවිට ජාතික නිෂ්පාදිතය ඉහළ ගියත් සමාජ සුභසාධනය උපරිම නොවේ.

4. ආතර් ලුවිස් ඔහුගේ ද්වි ආංශික ආකෘතිය ගොඩනැංවීමේදී ඇති කරගනු ලැබූ තවත් උපකල්පනයක් නම් ග්‍රාමීය අංශයේ ශ්‍රම අතිරික්තයක් පවතින බවයි. නමුත් මෑත කාලීන පර්යේෂණවලින් ඔප්පු වී ඇති පරිදි සංවර්ධනය වන රටවල නාගරික අංශයේ ද දැඩි සේවා වියුක්ති තත්වයක් පවතී.
5. ද්වි ආංශික ආකෘතියට අනුව මුළු ආර්ථික වර්ධන ක්‍රියාවලියම රඳා පවතින්නේ ධනවාදීන්ගේ ක්‍රියා කලාපය මතය. එනම් ධනවාදීන්ගේ ප්‍රාග්ධන රාශීකරණ ක්‍රියාවලිය අනුවය. නමුත් සංවර්ධනය වන රටවල ව්‍යවසායකත්වය සහ ආයෝජනවල මූලිකත්වය ගැනීම සම්බන්ධව එවැනි සමාජ පංතියක් එතරම් බලවත් නැත.
6. සංවර්ධනය වන රටවල ගුණක ක්‍රියාවලිය සිදු නොවන බව.

ආතර් ලුවිස්ගේ න්‍යාය මගින් ධනේෂ්වර පංතිය උපයන ලාභ නැවත නැවත පුනරායෝජනය කිරීමෙන් ප්‍රාග්ධන රාශීකරණයක් සිදුවන බව උපකල්පනයන කර තිබේ. නමුත් සංවර්ධනය වන රටවල ඒ ආකාරයට ආයෝජනයේ ගුණක ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොවන බවට විවේචන එල්ල වේ. වැටුප් මට්ටම් ඉහළ යයි නම්, භාණ්ඩ මිල මට්ටම් ඉහළ යන්නේ නම්, ධනවාදීන්ගේ අලාභ අඩු වේ නම්, කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය කාර්මික අංශයට උරා ගැනීමට ප්‍රථම ප්‍රාග්ධන සම්පාදනය නතර විය හැකිය.

7. සමස්ත ඉල්ලුම නොසලකා හැරීම.

ද්විත්ව ආර්ථිකය පිළිබඳ න්‍යායේදී ආතර් ලුවිස් විසින් සමස්ත ඉල්ලුම පිළිබඳව අවධානය යොමු නොකිරීමද, දුර්වලතාවයක් ලෙස සැලකේ. ධනවාදී අංශයේ නිෂ්පාදනයන් එම අංශය තුළ පරිභෝජනය කරන බව හෝ අපනයනය කරන බව හෝ ආතර් ලුවිස් උපකල්පනය කරයි. එහෙත් යැපුම් අංශය තුළ එකී නිස්පාදන අලෙවි කිරීමට ඇති හැකියාව පිළිබඳව ඔහු විග්‍රහ කර නැති බවට විවේචන එල්ල වේ.

8. ශ්‍රම සංක්‍රමණය පහසු කාර්යයක් නොවන බව.

ශ්‍රමිකයන්ට ඉහළ වැටුපත් ලැබූ පමණින් යැපුම් අංශයේ අතිරික්ත ශ්‍රමය කාර්මික අංශයට සංචලනය වේ යයි සිතිය නොහැකිය. සාම්ප්‍රදායික අංශයේ එනම්, ග්‍රාමීය කම්කරුවන් ඔවුන්ගේ ඉඩකඩම්, ගෙවල් දොරවල් සහ පවුල් සංස්ථාව සමඟ දැඩි බැඳීමකින් කටයුතු කරයි. බොහෝ විට සංවර්ධනය වන රටවල සමාජ සංස්කෘතික සාධක මගින් මෙම සංක්‍රමණ වලක්වනු ලැබේ. එමනිසා කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය ධනවාදී කාර්මික අංශයේ සේවා නියුක්ත කිරීම ආතර් ලුවිස් අපේක්ෂා කරන පරිදි පහසු කාර්යයක් විය නොහැකියි.

9. කෘෂිකාර්මික අංශයේ ආන්තික ඵලදාව ශූන්‍ය යයයි උපකල්පනය කිරීමද අතාත්විකය.

Theodor Shultz (1964) නම් ආර්ථික විද්‍යාඥයා ප්‍රකාශ කරන අන්දමට සංවර්ධනය වන රටවල කෘෂිකාර්මික අංශයේ ආන්තික ඵලදාව ශූන්‍ය විය නොහැකිය. සම්භාව්‍යවාදී ආර්ථික විද්‍යාඥයින්ට අනුව ශ්‍රමිකයන් ඔවුන්ගේ ආන්තික ඵලදාවට සමාන වැටුපක් ලබයි. එසේ වුවහොත් යැපුම් අංශයේ වැටුප් ශූන්‍ය විය යුතුය. එසේම යැපුම් අංශයේ සිට ශ්‍රමිකයන් නූතන කාර්මික අංශය තුළ සේවා නියුක්ත කිරීමේදී කෘෂි නිෂ්පාදනයට බලපෑමක් සිදු විය නොහැකි බව උපකල්පනය කෙරේ. එහෙත් කෘෂිකාර්මික අංශයේ යෙදී සිටින ශ්‍රමිකයන්ගෙන් 5% ක් වැනි පිරිසක් අඩු වුවහොත්, එමගින් මුළු නිමැවුමට බලපෑමක් ඇති නොවන්නේ යයි කිව නොහැකිය. කෘෂිකාර්මික අංශයේ පවතින වාරික සේවා වියුක්ති තත්වය තුළ කෘෂි නිෂ්පාදනයට බලපෑමක් ඇතිවිය හැකිය.

10. ඉතිරිකිරීම් පිළිබඳ දක්වන අදහස්වල ඌනතාවන්

ඉතිරිකිරීම් පිළිබඳව ආතර් ලුවිස් දක්වන අදහස් සංවර්ධනය වන රටවලට එතරම් අදාළ නොවන බවට විවේචන එල්ල වී තිබේ. සංවර්ධනය වන රටවල මුළු ජනගහනයෙන් 10% ක් පමණ ඉතිරිකිරීම් කරන බව ආතර් ලුවිස් දක්වයි. නමුත් මෙම රටවල අඩු ආදායම් ලබන පුද්ගලයෝ පවා නොයෙකුත් සමාජීය කරුණු මත, (අනාගත ආරක්ෂාව, හදිසි ආපදා අවස්ථා වැනි දෑ සඳහා) ඉතිරිකිරීම්වලට පුරුදු වී සිටිති. එසේම ඉහළ ආදායම් ලබන්නන්ගේ ඉතිරිකිරීම් ප්‍රාග්ධන සම්පාදනයට යොමු වනවාට වඩා වෙනත් සුඛෝපභෝගී මාර්ගවලට ඇදී යයි. බොහෝ විට ඔවුන්ගේ ඉතිරිකිරීම් මිල අධික යාන වාහන සුඛෝපභෝගී නිවාස මිලදී ගැනීම්, සමපේක්ෂණ කටයුතු සහ විවිධාකාරයේ විනෝද කාර්යන් ආදිය සඳහා යෙදවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ.

**11.** ශ්‍රම අතිරික්තය ඉවත් වීමට ප්‍රථම ශ්‍රම සැපයුම් වක්‍රය ඉහළ යා හැකි බව.

ආතර් ලුවිස්ගේ න්‍යායානුකූල විග්‍රහයට අනුව කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමයක් පවතින බවත්, එම ශ්‍රමය ස්ථාවර වැටුපකට කාර්මික අංශයේ සේවා නියුක්ත කළ හැකි බවත්, දක්වේ. එම අතිරික්ත ශ්‍රමය ඉවත් වූ පසු ශ්‍රම සැපයුම් වක්‍රය ඉහළ යා හැකි බව ද ආතර් ලුවිස් දක්වයි. නමුත් Ranis & Fee (1964) ප්‍රකාශ කරන පරිදි කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය අවසන් වීමට ප්‍රථම ශ්‍රම සැපයුම් වක්‍රය ඉහළ යා හැකිය. ඊට හේතුව වශයෙන් ඔහු ඉදිරිපත් කරන්නේ කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය ක්‍රමයෙන් ඉවත් වන විට එහි භූමිය හා ශ්‍රමය අතර ගැලපීමක් සිදුවන බවයි. එවිට කෘෂිකාර්මික අංශයේ ශ්‍රමිකයන්ගේ ආන්තික ඵලදාව ඉහළ යයි. එම නිසා පහත් පරිභෝජන මට්ටමක් යටතේ පැවති වැටුපකට තවදුරටත් කෘෂිකාර්මික අංශයේ ශ්‍රමිකයන් ශ්‍රමය සැපයීමට කැමති නොවන අතර, ශ්‍රම

අතිරික්ත්ය අවසන් වීමට ප්‍රථම පවා ශ්‍රම සැපයුම් වක්‍රය ඉහළ යා හැකි බව ඔවුන් දක්වා තිබේ.

**12.** කෘෂිකාර්මික අංශයේ මූර්ත වැටුප් ස්ථාවර නොවන බව

ආතර් ලුවිස් පැහැදිලි කරන අන්දමට කෘෂිකාර්මික අංශයේ මූර්ත වැටුප් මට්ටම ස්ථාවර එකක් බවත්, වැටුප් යැපුම් මට්ටමට වඩා ඉහළ යන විට ප්‍රාග්ධන සම්පාදන ක්‍රියාවලිය ඇන හිටින බවත්, උපකල්පනය කර තිබේ. මෙම උපකල්පනය ප්‍රායෝගික වශයෙන් සත්‍ය නොවන බවට විවේචන පවතී. බොහෝ රටවල නොයෙක් කම්කරු නීති රීති මගින් ඊට සීමාවන් පැනවේ. කම්කරු නීති රීතිවලට අනුකූලව ශ්‍රමිකයන්ගේ වැටුප් තීරණය වන අතර, මිල දර්ශකයන්ට අනුව වැටුප් ගැලපීම් ද සිදු කෙරේ. එවැනි තත්වයක් යටතේ මූර්ත වැටුප් ස්ථාවර යයි සිතීම ප්‍රයෝගික නොවේ.

**13** ආදායම් ව්‍යාප්තියේ අසමානතා ඇතිවිය හැකි බව

මෙම ආකෘතියට අනුව ධනවාදී අංශයේ ප්‍රාග්ධන සම්පාදනය ඉහළ වන විට ආදායම් ව්‍යාප්තියේ අසමානතාවයන් ඇති විය හැකි බවට විවේචන එල්ල වේ. ග්‍රාමීය අංශයේ සිට නාගරික අංශයට ශ්‍රමිකයන් සංක්‍රමණය වීමේදී නාගරික අංශයේ ශ්‍රම සැපයුම ඉහළ යාමෙන් රැකියාවන් සොයන ශ්‍රමිකයන් අතර ඇතිවන තරගය හේතුකොටගෙන වැටුප් මට්ටම පහළ වැටීමෙන් ආදායම් පරතරය ඉහළ යා හැකි බව ඔහු පෙන්වා දෙති. Simon Kuznets (1955) දක්වන ආකාරයට මෙම ආකෘථියට අනුව සංවර්ධනය වන රටවල ආදායම්විෂමතාව තවදුරටත් ඉහළ යා හැකිය. ආදායම් ව්‍යාප්තිය අසමාන වන විට ආතර් ලුවිස් අපේක්ෂා කරන පරිදි ඵලදායී ආයෝජනයක් සිදුවිය නොහැකිය.

**14.** පුහුණු ශ්‍රමය තාවකාලික අවහිරයක් නොවන බව

සංවර්ධනය ක්‍රියාවලිය සඳහා පුහුණු ශ්‍රමය හා නුපුහුණු ශ්‍රමය යන දෙකොටසම අවශ්‍ය වේ. සංවර්ධනය වන රටවල පුහුණු ශ්‍රමයේ හිඟයක් පවතින අතර, ආතර් ලුවිස් විසින් එය තාවකාලික සංසිද්ධියක් ලෙස සලකනු ලැබේ. කෙටිකාලීනව පුහුණු ශ්‍රමය පිළිබඳ ගැටලුවලට මුහුණ දීමට සිදු වුවත්, දිගුකාලීනව අධ්‍යාපනික හා පුහුණු කටයුතු මගින් එම තත්වය ජයගත හැකි බව ඔහු කියයි. නමුත් පුහුණු ශ්‍රමය සැපයීම ආතර් ලුවිස් දක්වන ආකාරයට සරල සංසිද්ධියක් නොවේ. පුහුණු ශ්‍රඹය සම්පාදනය කිරීම සඳහා දිගු කාලයක් ගතවන අතර, අධික වියදමක් ද දැරීමට සිදු වේ. පුහුණු ශ්‍රමය සම්ාදනය කිරීම සරල කටයුත්තක් යයි අදහස් කරනු ලැබුවත්, සංවර්ධනය වන රටවල සිදුවෙමින් පවත්නා බුද්ධි ගලනය පිළිබඳව ආතර් ලුවිස්ගේ අවධානය යොමු වී නැත. ඉංජිනේරුවන්, කාර්මික ශිල්පීන්, පුහුණු වෘත්තිය ශ්‍රමිකයන් ආදින් වැඩි වැටුප් අපේක්ෂාවෙන් සංවර්ධනය වූ රටවලට

සංක්‍රමණය වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. සංවර්ධනය වන රටවල සිදුවෙමින් පවත්නා ශ්‍රම සංක්‍රමණය හා බුද්ධි ගලනය පිළිබඳව ආතර් ලුවිස්ගේ අවධානය යොමු නොවීම දුර්වලතාවයකි.

15. ආතර් ලුවිස්ගේ න්‍යාය පැහැදිලි කරන අන්දමට ධනවාදී අංශයේ ලාභ වැඩි වන විට කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය ක්‍රමයෙන් ඉවත් වී යයි. එවිට ශ්‍රමය හා භූමිය අතර ඇතිවන ගැළපීම තුළින් කෘසිකාර්මිකයන්ගේ ද ඵලදායිතාව ඉහළ යයි. කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමයක් පවතින තුරු මෙම ක්‍රියාවලිය ද සිදුවිය හැකිය. ධනවාදී කොටස විසින් උපයනු ලබන ලාභව පුනරායෝජනය කිරීම මගින් ප්‍රාග්ධන සම්පාදනය සිදුවන බව ආතර් ලුවිස් දක්වයි. එහෙත් ඔහුගේ න්‍යාය තුළ තාක්ෂණික ප්‍රගතියේ ප්‍රතිඵලයක් ලෙස ලාභය වැඩිවීමක් සිදුවිය හැකි බව අමතක කර තිබේ.

ද්වි ආංශික ආකෘතිය ඉහත කී ආකාරයේ විවිධ සීමාකාරී තත්වයන්ට, විවිධ විවේචනයන්ට ලක්වී තිබුණද, එමගින් සංවර්ධනය වන රටවල ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය විග්‍රහ කිරීමෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු වී තිබේ. විශේෂයෙන්ම ප්‍රාග්ධන හිඟයකින් සහ ශ්‍රම බහුලතාවයකින් යුක්ත සංවර්ධණය වන රටවල කෘෂිකාර්මික අංශය හා කාර්මික අංශය අතර තුලිත වර්ධනයක් සිදුවන ආකාරය විග්‍රහ කිරීමේ න්‍යායක් මගින් ග්‍රාමීය සහ නාගරික අංශයේ ශ්‍රම හමුදාව අතර පවතින ව්‍යුහාත්මක හා ආර්ථික වෙනස්කම් හුවා දක්වන අතර, ග්‍රාමීය අංශයේ සිට නාගරික අංශයට කෙරෙන ශ්‍රම සංක්‍රමණය සහ ධනේශ්වර අතිරික්තය මත ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සිදුවන ආකාරරය විග්‍රහයට ලක් කෙරෙන න්‍යායක් වශයෙන් වැදගත්කමින් යුක්ත වේ.

එමෙන්ම කාර්මික, කෘෂිකාර්මික යන දෙඅංශයම ආර්ථික සංවර්ධනයෙහි ලා වැදගත්වන බව ආතර් ලුවිස් පෙන්වා දෙයි. ඔහුගේ අදහස් සමබර වර්ධන න්‍යාය ලෙස හඳුන්වයි.නොදියුණු රටවල් බොහොමයක මූලික කර්මාන්තය ලෙස සැලකෙන්නේ කෘෂිකර්මාන්ත ය. එමෙන්ම ජනගහනයෙන් වැඩි කොටසක් ජීවත් වන්නේ ද කාර්මික අංශයේ ය. මේ නිසා සංවර්ධන සැලසුම් පිළියෙළ කිරීමේදී කෘෂිකාර්මික අංශය වැඩි අවධානයක් යොමු කළ යුතුය.

ආතර් ලුවිස්ගේ ද්වි ආංශීය ආකෘතියට අනුව ආර්ථිකයේ ගතික ධනවාදී අංශයට ශ්‍රමය ලබාගනුයේ කෘෂිකර්මයයය. ආර්ථික සංවර්ධනයට ශ්‍රමය දායක කිරීම කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන අංශ මගින් සිදු වේ. (R.N. Soni, Keading Issues in Agriculrture Economics, Page 16). කෘෂිකාර්මික නොවන අංශ 03 ක් සඳහන් කළ හැකිය.

1. ස්වභාවික ජනගහනයේ සිදුවන වර්ධනය මගින්
2. සංක්‍රමණික කටයුතු හේතුවෙන්
3. කුලී ශ්‍රමය ලබාගැනීම

ආදී මූලාශ්‍රයන්ය.

කෘෂිකාර්මික අංශයෙන් කාර්මික සංවර්ධනයන සඳහා ශ්‍රමය දායක වන ආකාරය ඩබ්. ආතර් ලුවිස් විසින් 1954 දී Economic Development with Unlimited Supplyes of Labour නමැති නිපියෙන් ඉදිරිපත් කරයි. ( සෝමසුන්දර, දයානන්ද, සංවර්ධන ආර්ථික විද්‍යාව, පිටුව 36). මොහුගේ ද්වි ආංශික ආකෘතියට ප්‍රධාන වශයෙන් පදනම් වූයේ සංවර්ධනය වන රටවල සීඝ්‍ර ජන සංඛ්‍යා ප්‍රසාරණය වීමත් සමගම අතිරික්ත ශ්‍රම සැපයුමක් ජනිත වන්නේය යන තර්කයයි.

උෟණ සංවර්ධිත රටවල පවතින අසීමිත ශ්‍රම සැපයුම ආතර් ලුවිස් මේ ආකාරයට දක්වයි. ''පවතින ප්‍රාග්ධනය හා ස්වභාවික සම්පත්වලට සාපේක්ෂව බලන විට සමහර රටවල කොතරම් අධික ජනගහනයන් පවතීද යත් එම ආර්ථිකයන්හි ශ්‍රමිකයන් වැඩි කොටසක්ගේ ආන්තික ඵලදායිතාවය ඉමහත් පහත් තත්වයක ශුන්‍ය ත්වයක හෝ සමහරවිට සෘණ අගයක් ගත හැකිය.''

මෙම අතිරික්ත ශ්‍රමය කෘෂිකර්මය තුළ පමණක්නොව ආර්ථිකයේ සංවර්ධනයන් සමග ක්‍රමයෙන් කෘෂිකර්මයේ නියතු ශ්‍රම ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් අඩුවේ. කෘෂිකර්මයේ ඒක පුද්ගල ඵලදාව ඉහළ යාම නිසා කෘෂි අංශයේ අතිරික්ත නිෂ්පාදනය ඉහළ යන අතර, අනෙක් කෘෂි අංශයෙන් කාර්මික අංශයට මුදාහැරිය හැකි ශ්‍රමිකයන්ප්‍රමාණය ද ඉහළ යයි. කෘෂි අංශයෙන් ඉවත් කළ හැකි ශ්‍රමිකයින් කොටසක් සිටින බව සමහර ආර්ථික විද්‍යාඥයන් පෙන්වති.

**නිගමනය**

ලංකාව් ජාතික ආදායමෙන් 50% කට ලැබෙනුයේ කෘෂිකාර්මික අංශයෙනි. 1957 දළ දේශීය නිෂ්පාදිතයෙන් 54.4% ලැබෙනුයේ කෘෂිකර්මාන්තයෙනි. කර්මාන්ත වලින් 6% ක් ලැබෙනුයේ පවතින දෙඅංශයෙන්ම සංවර්ධනයන් ඇති කිරීමට,

1. කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය වැඩි කළ යුතුය.
2. කාර්මික භාණ්ඩ කොටසක් නිර්යාත කොට උපයන විදේශ විනිමයෙන් කෘෂිකාර්මික භාණ්ඩ ආයාත කිරීම.
3. කාර්මික භාණ්ඩ නිෂ්පානය ආයාත ආදේශකයන් නම් සංඛ්‍යාව උපයන විදේශ විනිමයෙන් කෘෂි භාණ්ඩ ආයාත කිරීමක් කරනු ලැබේ.

කෘෂි කර්මාන්තයේ ආයතන කිරීම වැඩි වුවහොත් ගෙවුම් ශේෂ අර්බුද ඇති වේ. එම නිසා කෘෂි හා කාර්මික ක්ෂේත්‍ර දෙකට නිර්ගත දක්වා වර්ධනය කළ යුතුය. කෘෂිකාර්මික හෝ කාර්මික අංශය වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරීමෙන් සංවර්ධනයෙන් ලබාගත නොහැකිය. ඒ නිසා දෙ අංශයකට එක්වන සංවර්ධනය කළ යුතු වේ.

දියුණුවන රටවල ජනගහන වර්ධණ සංවර්ධිත රටවලට වඩා වේගවත් ය. ඉල්ලුම වර්ෂයෙන් වර්ෂයට සීඝ්‍රයෙන් ඉහළ යයි. මෙම රටවල සතුටුදායක පරිභෝජන

මට්ටමක් ලබාගැනීමට නම් දේශීය නිෂ්පාදිතය වැඩි කළ යුතුය. ඒ සඳහා කෘෂිකාර්මික අංශය සංවර්ධනය කළ යුතුය.
රටවල කාර්මිකවීමත් සමඟ කාර්මික අංශයේ නියුක්ත ශ්‍රමිකයාගේ ඵලදාවේ වටිනාකම කෘෂිකාර්මික අංශයේ නියුක්ත ශ්‍රමිකයකුගේ ඵලදාවේ වටිනාකම වැඩි වුවහොත කාර්මික කිරීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීම උචිතය.

කෘෂිකාර්මික භාණ්ඩවල මිල නිතර උච්චාවචනය වන අතර, කෘෂිකාර්මික ආර්ථිකයේ නිතර අස්ථායිතාවන් හට ගනී. එහෙත් කාර්මික භාණ්ඩවල මිල සථායිතාව උච්චාවචනයට භාජනය නොවන අතර ස්ථාවර ආදායමක් බලාපොරොත්තු විය හැකි. මේ අනුව ආර්ථිකයෙන් ස්ථායිභාවය ආරක්‍ෂා කර ගැනීම සඳහා කාර්මිකකරණය වඩා වැදගත් ය. මේ ආකාරයට ද්වි අංශ්‍රික අකෘතිය ශ්‍රී ලංකාව් ආර්ථික සංවර්දනයට උපයෝගී කර ගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


මාහාචාර්ය දයානන්ද සොමසුන්දර ,කෘෂි අර්ථික විද්‍යාව,ප්‍රථම මුද්‍රණය 1997 චතුරමුද්‍රණය ශ්‍රිල්පියෝ ,ප්‍රකාශනය ඇස් ගොඩගේ සහ සහොදරයෝ.

එස් . එම් .පී සේනානායක ,කෘෂි අර්ථික විද්‍යාව,ප්‍රථම මුද්‍රණය 2008

ජ්‍යෙෂ්ඨ මාහාචර්ය ප්‍රේමා පොඩිමැණිකේ මිය. , 2000 ,"ආර්ථික සංවර්ධ න්‍යාය" ප්‍රකාශකයෝ ඇස් ගොඩගේ සහ සහොදරයෝ

Hunt Diana " W.A Lewis on economic development with unlimited supplies of llabour " 1989 , New York; Harvester Wheatshef.

Gollin Doglas "economic Development with Unlimited Supplies of labour " 2014 , Jounal of Economic perspectives

Lewis dual sector model , Archived from the original on april 6 ,2012Ghatak

.S. and Ingersent ,K. "Agriculture and Economic Development ", Harvesrter Press 1984.

Frank fillis "Agriculture Policies in Developing countries , CambrigeUnivercity Press 1992

https://en.wikipedia.org/wiki/Dual-sector_model